රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 02/2023

මගේ අංකය : EST-6/04/LON/1040(ii)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.12.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම</u>**

ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11:10:2 උප වගන්තිය සහ 2016.05.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2016 මඟින් සංශෝධිත එම පරිච්ඡේදයේ 11:8:8 උප වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. බැංකු මඟින් දේපළ ණය ලබාගෙන ඇති රාජ්‍ය නිලධරයෙකු, සේවා කාලය තුළ දී මිය ගියේ නම් හෝ පූර්ණ අකර්මණ්‍යතාවට පත්වූයේ නම් හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද්දේ නම් හෝ එදිනට බැංකුව වෙත ගෙවීමට ඇති ණය ශේෂය පමණක් ණය ඇපකර අරමුදල මඟින් බැංකුව වෙත එකවර නිරවුල් කිරීමට රජය විසින් කටයුතු කරනු ලැබුව ද, ප්‍රස්තුත ණය ශේෂ පියවීම සඳහා අත්‍යවශ්‍යයෙන් ම ඉදිරිපත් කළ යුතු ලේඛන, ආයතන මඟින් නිවැරදිව යොමු නොකිරීමෙන් ණය මුදල් පියවීම ප්‍රමාද වන අවස්ථා සහ නිලධරයෙකු ස්ථාන මාරු වීමේ දී දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු යාවත්කාලීන කර නව සේවා ස්ථානය වෙත කඩිනමින් යොමු නොකිරීම හේතුවෙන් ණය මුදල් සම්බන්ධයෙන් අදාළ කටයුතු සිදු කිරීම ප්‍රමාද වන අවස්ථා පවතින බවට නියෝජන ඉදිරිපත්ව ඇත.

03. ඉහත සඳහන් අඩුපාඩු නිසා සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා, පහත පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ පවතින සියලු ආයතනවල ප්‍රධානීන් වෙත දැනුම් දෙන ලෙස දන්වා සිටිමි.

(අ) දේපළ ණය ලබාගැනීමට අදාළ ලේඛන යාවත්කාලීන කරමින් නඩත්තු කළ යුතු ය.

(ආ) ණය අයදුම්පත හා ණය වාරික ගෙවීම පිළිබඳ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය.

(ඇ) නිලධරයෙකු ස්ථානමාරු ලබා යාමේ දී ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 11:10:2 උප වගන්තිය ප්‍රකාරව 25 වැනි පරිශිෂ්ටයට අනුකූලව අදාළ තොරතුරු නව සේවා ස්ථානය වෙත කඩිනමින් යොමු කර එහි පිටපතක් පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු ය.

(ඈ) ණය ඇපකර අරමුදල මඟින් ණය ශේෂ පියවන අවස්ථාවල දී අත්‍යවශ්‍යයෙන් ඉදිරිපත් කළ යුතු ලේඛන නිවැරදිව යොමු කළ යුතු ය.


කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk